(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත

---

[සහතිකය සටහන් කළේ **1999** ඔක්තෝබර් මස **07** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ඔක්තෝබර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **10.25**. තැපැල් ගාස්තුව : රු. **5.25**.

# 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත

[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වැනි දින.]

එල්. ඩී.–ඕ. 31/97.

**ශ්‍රී ලංකාව තුළ ඇති ශාකවලට හානිකර හෝ හිංසාකාරී හෝ විනාශකාරී වූ යම් ජීවියකු, ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට ද , ඒ තුළ ව්‍යාප්ත කිරීමට ද එරෙහිව සහ ශ්‍රී ලංකාව තුළ ඇති ශාකවල නිරෝගී බව ආරක්ෂා කිරීම සඳහා ද (447 වන අධිකාරය වූ) ශාක ආරක්ෂක ආඥාපනත ඉවත් කිරීම සඳහා ද , ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස
## පනත පරිපාලනය කිරීම

**2**. (මින් මතු මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, මේ පනත යටතේ ඔහු වෙත නියම කරන ලද හෝ පවරන ලද කර්තව්‍ය ඉටු කිරීම සඳහා මේ පනතේ සාමාන්‍ය පරිපාලනය භාරව කටයුතු කළ යුතු ය. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

**3**. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා තමාට සහාය වීම පිණිස අවශ්‍ය විය හැකි, "බලයලත් නිලධරයන්" යනුවෙන් හැඳින්විය යුතු නිලධරයන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලැබිය යුතු ය. බලයලත් නිලධරයන්.

## II වන කොටස
## ක්‍රියා පටිපාටිය

**4**. (1) යම් පරිශ්‍රයක පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් සිටී ද යන්න පරීක්ෂා කිරීමේ හෝ පරීක්ෂණ පැවැත්වීමේ කාර්යය සඳහා පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් සිටින බවට සැක කරනු ලබන යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සාධාරණ හේතු ඇති බවට, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා පරිශ්‍රයන්ට ඇතුළුවීම.

නිලධරයෙක්, සහායකයන් ඇතිව හෝ සහායකයන් නොමැතිව සියලුම සාධාරණ අවස්ථාවන්හි දී ඇතුළුවීම නීත්‍යානුකූල වන අතර, අවස්ථාවෝචිත පරිදි, එම පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් ආනයනය කරන ලද තැනැත්තා හෝ එම පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු එවැනි පරීක්ෂා කිරීමකට හෝ පරීක්ෂණයකට අවශ්‍ය සියලු සාධාරණ පහසුකම් සැලැස්විය යුතු ය. පරිශ්‍රයකට ඇතුළුවීමට පෙර බලයලත් නිලධරයාගේ අනන්‍යතාවය, පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට පෙන්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරීක්ෂා කිරීමෙන් සහ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ඒ පරිශ්‍රයේ පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා සෑහීමකට පත්වන්නේ නම්, එකී පළිබෝධයේ හෝ පළිබෝධ කිසිවකගේ ස්වභාවය සහ එවැන්නක් හෝ එවැනි පළිබෝධ ව්‍යාප්තවීමට ඇති ඉඩකඩ සැලකිල්ලට ගෙන, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා විසින් තම තීරණය සහ එම තීරණයට හේතු ද ලිඛිතව ආනයනකරුට, අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්විය යුතු අතර, එම පළිබෝධය හෝ පළිබෝධ කිසිවක් මැඩපැවැත්වීම හෝ පැතිරයාම වැළැක්වීම සඳහා එම විධානයේ දක්වා ඇති ගතයුතු පියවර හෝ ක්‍රියාත්මක කළ යුතු කටයුතු කරන ලෙස අවස්ථාවෝචිත පරිදි, ඒ ආනයනකරුට හෝ එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට විධාන කළ යුතු ය.

3. අවස්ථාවෝචිත පරිදි ඒ පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් ආනයනය කරන්නා හෝ ඒ පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා විසින් කරන ලද විධානයට අනුව කටයුතු කළ යුතු අතර, ආනයනකරු, අයිතිකරු හෝ පදිංචිකරු, එම විධානයට එරෙහිව 9 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් පමණක් එසේ නොකළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා හෝ ඔවුන්ට සහාය වන තැනැත්තකු ඇතුළුවීම ආදිය හේතුකොට අයුතු ලෙස ඇතුළුවන්නකු ලෙස නොසැළකිය යුතු බව.

**5**. අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා හෝ ඔවුන්ට සහාය වන යම් තැනැත්තකු, යම් පරිශ්‍රයකට ඇතුළුවීමේ හේතුවෙන් හෝ ශාක හෝ ශාක නිෂ්පාදන විනාශ කිරීමේ හේතුවෙන් හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ කරන ලද යම් ක්‍රියාවක් හෝ කරන ලද යම් දෙයක් හේතුකොට ගෙන, අයුතු ලෙස ඇතුළුවන්නකු ලෙස සළකනු නොලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ

පනත යටතේ සාදන ලද යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීම අත්හැරීමේ හේතුව මත, එසේ ක්‍රියාත්මක කිරීම හෝ අත්හැරීම කරන ලද්දේ අසද්භාවය හෝ සාධාරණ සහ විය හැකි වූ හේතුවක් නොමැතිව නම් මිස, එසේ ක්‍රියාත්මක කිරීම හෝ අත්හැරීම සම්බන්ධයෙන් යම් වන්දියකට හෝ නඩු පැවරීමකට යටත් නොවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ බලයලත් නිලධරයාට පියවර ගැනීමට හෝ වැඩ ක්‍රියාත්මක කිරීමට සහ ඊට වැය වූ වියදම් අයකර ගැනීමට ඇති බලය.

**6.**(1) 4 වන වගන්තිය යටතේ, යම් පරිශ්‍රයක හෝ පරිශ්‍රයක් මත යම් පියවරක් ගැනීමට හෝ වැඩ ක්‍රියාත්මක කිරීමට පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් ආනයනකරුවකුට හෝ යම් පරිශ්‍රයක අයිතිකරුවකුට හෝ පදිංචිකරුවකුට නියම කර හෝ විධාන කර ඇති අවස්ථාවක, ඒ නියමය හෝ විධානය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා පැහැර හරින්නේ නම්, නොසළකා හරින්නේ නම් හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා සහායකයන් ඇතුව හෝ නැතිව ඒ පියවර ගැනීමේ හෝ වැඩ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඒ පරිශ්‍රයට ඇතුළුවිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයකට ඇතුළුවන අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයෙක්, (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම පහසු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි උපකරණ, යන්ත්‍රෝපකරණ සහ වාහන ඔහු විසින් රැගෙන යා හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයක හෝ පරිශ්‍රයක් මත යම් පියවර ගැනීමේ හෝ යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් බලයලත් නිලධරයකු විසින් දරන ලද සියලු සාධාරණ වියදම් සහ රජය විසින් දරන ලද සියලු වියදම් එම පියවර ගැනීමට හෝ එම වැඩය ක්‍රියාත්මක කිරීමට 4 වන වගන්තිය යටතේ නියමය ලද හෝ විධානය ලද තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු අතර, එම වියදම් එම තැනැත්තාගෙන් මෙහි මින් මතු දැක්වෙන පරිදි අය කර ගත හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු සියලු සාධාරණ වියදම් එම තැනැත්තා පදිංචි ප්‍රදේශයේ හෝ යම් පියවරක් ගැනීමට හෝ වැඩක් ක්‍රියාත්මක කිරීමට තිබූ ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්

හෝ යම් බලයලත් නිලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, එම අධිකරණය විසින් පනවනු ලබන දඩයක ආකාරයට අයකර ගනු ලැබිය හැකි අතර, (3) වන උපවගන්තියේ සඳහන් එම වියදමේ ප්‍රමාණය එම අධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය සාමාන්‍ය ලෙස ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වඩා වැඩි වුව ද එය නොතකා, අය කර ගනු ලැබිය හැකි ය.

5. යම් තැනැත්තකු වෙත (4) වන උපවගන්තිය යටතේ දඩයක් පැනවීම හේතුවෙන්, 4 වන වගන්තිය යටතේ කරන ලද නියමයකට හෝ විධානයකට එකඟව ක්‍රියා කිරීමට එම තැනැත්තා අපොහොසත් වීමේ, පැහැර හැරීමේ, ප්‍රතික්ෂේප කිරීමේ හේතුව නිසා ඔහු යටත් විය හැකි යම් වරදක් සඳහා වූ යම් නඩු පැවරීමකින්, එම තැනැත්තා නිදහස් කරනු නොලැබිය යුතු ය.

## III වන කොටස

## නිරෝධායන පළිබෝධයන්

නිරෝධායන පළිබෝධයන්.

7. (1) මේ වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ආනයනය කරනු ලබන්නේනම් මිස, නිරෝධායන කරන ලද පළිබෝධ වශයෙන් හෝ යම් ශාකයක හෝ ශාක නිෂ්පාදනයක් මත වූ ආසාදනයක් වශයෙන් හෝ ශ්‍රී ලංකාවට ආනයනය නොකළ යුතු, නිරෝධායන පළිබෝධයන්, අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නිරෝධායන පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක ඇති බවට යම් තැනැත්තකුට සාධක ඇත්නම් ඒ බව ඔහු විසින් වහාම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(3) තත්කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් නිශ්චිත ලිඛිත උපදෙස් යම් තැනැත්තකුට ලැබී ඇත්නම් මිස, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් නිරෝධායන පළිබෝධයකින් ආසාදනය වී ඇති යම් ශාකයක් හෝ ශාක නිෂ්පාදනයක් කිසිම තැනැත්තකු විසින් දැන දැනම ළඟ තබා ගැනීම, විකිණීම, වගා කිරීම, මුදා හැරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ දැන දැනම ළඟ තබා ගැනීමට, විකිණීමට, වගා කිරීමට, මුදා හැරීමට, බෙදා

හැරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට කටයුතු සැලැස්වීම කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (3) වන උපවගන්තියෙහි සඳහන් යම් ශාකයක් හෝ ශාක නිෂ්පාදන විනාශ කිරීම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ බලයලත් නිලධරයකුට භාරදීම, (3) වන උපවගන්තියේ සඳහන් කිසිවක් මගින් තහනම් කරනු නොලැබිය යුතු ය.

(5) ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් තුළ යම් නිරෝධායන පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයාට යම් තොරතුරක් ලැබුණහොත් එම පළිබෝධය හෝ පළිබෝධ කිසිවක් පාලනය කිරීම සඳහා ඔහු විසින්, අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි සියලු පියවර වහාම ගත යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් නිරෝධායන පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් හෝ එම පළිබෝධය හෝ පළිබෝධ කිසිවක් මගින් ආසාදනය වූ යම් ශාකය හෝ ශාක නිෂ්පාදන, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දීමෙන් පසු සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ආනයන බලපත්‍රයක අධිකාරය යටතේ සහ ආනයනය කරන ලද ද්‍රව්‍ය නිසි පරිදි නිරෝධායනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සහ පුහුණුව ලත් පුද්ගලයන් පිළිබඳ කොන්දේසි ඇතුළුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට අනුකූලව, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින්, තනිකර විද්‍යානුකූල අධ්‍යාපනය සඳහා පමණක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම කරනු ලැබිය හැකි ය.

(7) නිරෝධායන පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් නැතහොත් එම පළිබෝධය හෝ පළිබෝධවලින් ආසාදනය වූ ශාකයක් හෝ ශාක නිෂ්පාදන (6) වන උපවගන්තිය යටතේ ආනයනය කිරීම, විද්‍යාත්මක පර්යේෂණවල නියුතු රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක ප්‍රයෝජන සඳහා පමණක් සිදුකළ යුතු අතර, එසේ කළ යුත්තේ ද එම දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සංස්ථාවේ එම පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් නැතහොත් එම ශාක හෝ ශාක

නිෂ්පාදන නිරෝධායනය කිරීම සහ සීමාකොට තබා ගැනීම සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි, පුහුණු තැනැත්තන් ඇතුළු නිසි පහසුකම් ඇත්නම් පමණි.

## IV වන කොටස

## අභියාචන

අභියාචන මණ්ඩලයේ සංයුතිය.

**8**. (1) මේ පනතේ කාර්යය සඳහා අභියාචන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ලේකම්වරයා විසින් පත් කරනු ලබන කෘමි විද්‍යාව, ශාක ව්‍යාධි වේදය, ක්ෂුද්‍ර ජෛව වේදය, දිලීර විද්‍යාව, වෛරස වේදය හෝ නිමටෝඩවේදය යන ක්ෂේත්‍රවල සුදුසුකම් ලැබුවා වූ විද්‍යාඥයන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත වූ මණ්ඩලයකට අයත්, සාමාජිකයන් තිදෙනකුගෙන් අභියාචන මණ්ඩලය සංයුක්ත විය යුතු ය.

(3) එම අභියාචන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස, පත්කළ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු, ලේකම්වරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

අභියාචන.

**9**. (1) 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ බලයලත් නිලධරයකුගේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එම තීරණය තමා වෙත දැනුම් දී පැය හැත්තෑ දෙකක් ඇතුළත එම තීරණයට එරෙහිව ලේකම්වරයා වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර එම අභියාචනයෙහි ඒ සඳහා වූ හේතු සඳහන් කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමට ලියන ලද බැංකු අණකරයකින් හෝ මුදල් ඇණවුමක් මගින් ලේකම්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ප්‍රමාණයක මුදල් තැන්පතුවක් අභියාචනය සමග ඉදිරිපත් කළ යුතු ය. අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ බලයලත් නිලධරයාගේ තීරණය අභියාචනය මගින් ඉවතලන්නේ නම් පමණක් තැන්පත් කරන ලද මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(3) ලේකම්වරයා වෙත අභියාචනය ලැබීමෙන් පසු 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අභියාචන මණ්ඩලය දින දෙකක් තුළ දී පත් කළ යුතු අතර, එසේ පත්කරනු ලබන අභියාචන මණ්ඩලය දින හතක කාලයක් තුළ දී තීරණය ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය. අභියාචන මණ්ඩලයේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර ලේකම්වරයා විසින් එම තීරණය වහාම අභියාචකට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ බලයලත් නිලධරයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

## V වන කොටස

## වැරදි සහ දණ්ඩන

**10**. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් නීත්‍යානුකූල අධිකාරය හෝ අවසරය නොමැතිව කඩ කරන හෝ මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ ඔහු විසින් නොකළ යුතු හෝ අත් නොහැරිය යුතු යම් දෙයක් ඔහු විසින් කරන හෝ අත්හරින නැතහොත් අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ යම් බලයලත් නිලධරයකුට හෝ ඔවුන්ට සහාය වන යම් තැනැත්තකුට මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ දී, ප්‍රතිරෝධය පාන හෝ අවහිර කරන නැතහොත් ප්‍රතිරෝධය පෑමට හෝ අවහිර කිරීමට සහාය වන හෝ ප්‍රතිරෝධය පෑමට හෝ අවහිර කිරීමට යම් තැනැත්තකු පොළඹවන ඕනෑම තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය. වැරදි.

(2) මේ පනත යටතේ වරදක් කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී වරදකරු කරනු ලැබූ විට, මාස එකකට නොඅඩු සහ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) මේ පනතට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට එරෙහිව වූ යම් වරදක් සඳහා නිශ්චිතව දැක්වෙන දඬුවම මහෙස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවන්නේ වුව ද, එය නොතකා මේ පනතට එරෙහිව වූ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයකට එරෙහිව වූ යම් වරදක් ලඝුකාර්ය පටිපාටිය අනුව මහෙස්ත්‍රාත්වරයකු විසින් විභාග කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(4) මේ පනතට එරෙහිව වූ යම් වරදක් සිදු කිරීමෙහි ලා හෝ ඊට සම්බන්ධව භාවිත කරන ලද යම් වාහනයක් හෝ ප්‍රවාහනය කරන්නක් හෝ වෙනත් උපකරණයක්, සැලසුමක්, මෙවලමක් හෝ ද්‍රව්‍යයක්, එසේ දඬුවම් ලැබීම කරණකොටගෙන, රජය සන්තක කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක අධිකාරය යටතේ යම් ක්‍රියාවක් ඉටු කිරීමේ මුවාවෙන් අනවශ්‍ය සැහැසි ක්‍රියාවකට වරදකරු වන හෝ යම් තැනැත්තකුට අනවශ්‍ය පාඩුවක් හෝ අනවශ්‍ය කරදරයක් සිදුකරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි.

11. යම් පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක -ඕ

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද කරන ලද වේලාවේ දී, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුව, කළමනාකරුවකුව, ලේකම්ව හෝ ඒ සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම: හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය වෙළෙඳ ආයතනයක් නම්, ඒ වරද කරන ලද වේලාවේ දී ඒ වෙළෙඳ ආයතනයේ හවුල් කරුවකුව සහ කළමනාකරුව, සිටි සෑම තැනැත්තෙක් ම,

ඒ වරද තමාගේ එකඟත්වය හෝ දැනීම නොමැතිව කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි ලෙස සියලු උද්යෝගයෙන් කටයුතු කළ බව හෝ ඔහු ඔප්පු කළහොත් මිස, ඒ වරද කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## සාමාන්‍ය කරුණු

**12**. (1) නියෝග සෑදිය යුතු කරුණක් ලෙස මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් අවශ්‍ය වූ හෝ බලය දෙනු ලැබ ඇති හෝ යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන්ම සහ (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව අමාත්‍යවරයා විසින් -

(අ) පළිබෝධයන් ශ්‍රී ලංකාවට හඳුන්වාදීම වැළැක්වීම සඳහා හෝ පළිබෝධකයන් මුලින් උපුටා දැමීම සඳහා හෝ පළිබෝධයන් පැතිරීම වැළැක්වීම සඳහා සහ ශාක, ශාක නිෂ්පාදන හෝ ජීවීන් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම සඳහා ;

(ආ) යම් ශාකයක්, ශාක නිෂ්පාදනයක් සහ ජීවීන් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සීමා කරමින් හෝ තහනම් කරමින් හෝ සහ ඒවා ගොඩබිමට ගෙන ආ හැකි ස්ථාන සීමා කිරීම සඳහා හෝ තහනම් කිරීම සඳහා ;

(ඇ) සම්පූර්ණයෙන් හෝ කොන්දේසි සහිතව ශාක, ශාක නිෂ්පාදන සහ ජීවීන් ශ්‍රී ලංකාවට ගොඩබෑම සීමා කිරීම සඳහා හෝ තහනම් කිරීම සඳහා ;

(ඈ) විශේෂ බලපත්‍ර සහ කොන්දේසි යටතේ ජීවීන් ආනයනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ;

(ඉ) ගොඩබාන අවස්ථාවේ දී හෝ ඊට පෙර හෝ ඊට පසු හෝ ශාක, ශාක නිෂ්පාදන සහ ජීවීන් සෝදිසි කිරීම සඳහා හෝ පරීක්ෂා කිරීම සඳහා ;

(ඊ) ආනයනකරුගේ හෝ අයිතිකරුගේ වියදමින් පරීක්ෂා කිරීම, පිරිසිදු කිරීම, දුම් ගැසීම හෝ විෂබීජ නාශක යෙදීම සහ යම් පළිබෝධයකින් හෝ පළිබෝධ කිසිවකින් ආසාදනයව ඇති බවට සොයාගනු ලැබුවහොත්, යථෝචිතව එම සියලු ශාක, ශාක නිෂ්පාදන සහ ජීවීන් හෝ එම ද්‍රව්‍ය අසුරා ඇති ඇසුරුම් පෙට්ටි හෝ බඳුන් හෝ ආවරණ සියල්ල වන්දි ගෙවීමක් නොමැතිව ගොඩබෑමේ අවස්ථාවේ දී

හෝ ඊට පෙර හෝ ඊට පසු අවශ්‍ය නම් විනාශ කිරීම සඳහා සහ ආනයනකරු හෝ අයිතිකරුගෙන් ඒවා විනාශ කිරීම සඳහා හෝ නියමිත ගාස්තු අයකර ගැනීම සඳහා ;

(උ) ආනයනය කරන ලද හෝ ආනයනය කිරීමට ඇති ශාක, ශාක නිෂ්පාදන සහ ජීවීන් නිරෝධායනය කර, විශේෂ ප්‍රදේශවල වෙන්කර තැබීමට නියම කිරීම සඳහා සහ එසේ වෙන්කර තැබීම සඳහා කොන්දේසි පැනවීම සහ එම කරුණු සඳහා අයකළ යුතු ගාස්තු අය කිරීම සඳහා ;

(ඌ) ශ්‍රී ලංකාව තුළ යම් පළිබෝධයක් පැතිරීම හෝ බෝවීම වැළැක්වීම සඳහා ;

(එ) රෝග බෝවී ඇති ප්‍රදේශයක් ලෙස යම් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සඳහා සහ යම් පළිබෝධයක් බෝවී ඇති ප්‍රදේශයක් බවට ප්‍රකාශිත යම් නිශ්චිත ප්‍රදේශයක් සුදුසු පරිදි නිරෝධායනය කිරීම සඳහා ;

(ඒ) යම් පළිබෝධයක් හේතුකොටගෙන ඉන් බලපෑමක් ඇතිවීමට හෝ බලපෑමක් ඇතිවීමට ඉඩ ඇති යම් ශාකයක් හෝ ශාක නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා, ප්‍රතිකාර කිරීම සඳහා හෝ විනාශ කිරීම සඳහා හෝ නිසි පරිදි බැහැර කිරීම සඳහා ;

(ඔ) ශ්‍රී ලංකාව තුළ යම් නිශ්චිත ප්‍රදේශයක හෝ ප්‍රදේශවල යම් නිශ්චිත කාලයක් හෝ කාල සීමාවක් සඳහා යම් ශාකයක් හෝ ශාක වගා කිරීම සීමාකිරීම හෝ තහනම් කිරීම සඳහා;

(ඕ) ශ්‍රී ලංකාවේ යම් භූමි ප්‍රදේශයක සිට තවත් භූමි ප්‍රදේශයකට ශාක, ශාක නිෂ්පාදන හෝ ජීවීන් ගෙනයාම ක්‍රමවත් කිරීම සඳහා,

(ක) අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ බලයලත් නිලධරයන්ට උපදෙස් දීම සඳහා කමිටු සංස්ථාපනය කිරීම සඳහා සහ මේ පනතේ විධිවිධාන සාර්ථක ලෙස පරිපාලනය කිරීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් ක්‍රියාවක් කිරීම සඳහා ;

(ග) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන ශාක. ශාක නිෂ්පාදන හෝ ජීවීන්ගේ යහපත් සෞඛ්‍ය තත්ත්වයක් සහතික කිරීම සඳහා ; සහ

(ච) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා,

නියම කරමින් නියෝග සෑදිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනක සිට හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) මෙම පනත යටතේ සාදන ලද සෑම නියෝගයක් ම මේ පනතේ අඩංගු වූවා සේ සමානව බලාත්මක විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනනුමත දින සිට ඒ යටතේ එතෙක් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයක් එසේ යම් දිනයක සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන විට, ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**13**. (1) ශාක ආරක්ෂක ආඥාපනත (447 වන අධිකාරය වූ) මෙයින් ඉවත් කරනු ලැබේ.

447 වන අධිකාරය ඉවත් කිරීම සහ ශේෂ කිරීම.

(2) ඉහත කී ආඥාපනත ඉවත් කරනු ලැබුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද, ඉවත් කෙරෙන ආඥාපනත යටතේ සාදනු ලැබුවා වූ ද, සෑම නියෝගයක් ම, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් කල් මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් සංශෝධනය හෝ පරිච්ඡින්න කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## VII වන කොටස

## අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය.

**15**. (1) පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, මේ පනතේ -

" ජාන විකරණය කරන ලද" යන්නෙන්, කවර හෝ ක්‍රමයක් උපයෝගී කරගෙන සෛලයකින් බාහිරව උත්පාදනය කරගනු ලැබූ නියුක්ලික් අම්ල අනු, වයිරසයක්, බැක්ටීරියා ප්ලාස්මිඩයක් හෝ වෙනත් යම් වාහක පද්ධතියක් සම්බන්ධවීමෙන්, ස්වාභාවිකව සිදු නොවන එහෙත් ප්‍රජනනය කරගෙන යාමේ හැකියාව ලබා දෙන පරිදි ආගන්තුක ජීවියකු තුළට ඇතුළු කොට එවැනි ආගන්තුක ජීවියකුට ඒකාබද්ධවීමට සැලැස්වීමෙන්, උරුම විය හැකි ද්‍රව්‍යවල නව සංයෝගයක් සෑදීමට හෝ ව්‍යුත්පාදනය කිරීමට හෝ සම්බන්ධ නැතහොත් එවැනි ප්‍රතිඵලයක් ගෙන දෙන යම් ක්‍රියාකාරීත්වයකින් ව්‍යුත්පාදනය කරන ලද යන්න අදහස් වේ ;

" ආනයනකරු " යන්නෙන් -

(අ) ආනයනකරු වශයෙන් බඩු භාර දෙන්නකු හෝ භාරගත්තකු හෝ වශයෙන්, නියෝජිතයකු, වශයෙන් තැරැව්කරුවකු වශයෙන් හෝ යම් ශාකයක්, ශාක නිෂ්පාදනයක් හෝ ජීවියකුගේ සන්තකය දරන හෝ භාරකාරත්වය හෝ පාලනය දැරීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක් අදහස් වේ ;

(ආ) යම් ශාකයක්, ශාක නිෂ්පාදනයක් හෝ ජීවියෙක් ශ්‍රී ලංකාවට ගොඩබානු ලැබුවේ හෝ ඇතුල් වූයේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක් මගින් ද, ඒ තැනැත්තා අදහස් වේ ;

" ජීවය විහරණය කළ" යන්නෙන්, ප්‍රතිසම්බන්ධිත ඩීඑන්ඒ තාක්ෂණය, අනුක ජීව විද්‍යාව, සෛල හෝ පටක වගාව,සෛල සමයෝජනය, කෘත්‍රිම පරම්පරා ප්‍රත්‍යාවර්තනය වැනි ජීව විද්‍යාත්මක තාක්ෂණය උපයෝගී කොටගෙන හෝ වයිරස, භක්ෂය, ප්ලාස්මිඩ යනාදිය වැනි වාහක පද්ධතියක් උපයෝගී කරගෙන, එහෙත් ස්වභාවිකව සිදුවන සම්භෝගය, විකෘතිකරණය හෝ ප්‍රතිසංයෝග කිරීමේ ක්‍රියාවලියක් මගින් නොව, යම් ජීවියකුගේ ජාන ද්‍රව්‍ය වෙනස් කිරීමෙන් හෝ විකිරණය කිරීමෙන් ව්‍යුත්පන්න කොට ගත් හෝ නිපදවාගත් යන්න අදහස් වේ. ;

" අමාත්‍යවරයා" යන්නෙන්, කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

" පදිංචිකරු" යන්නට යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් වන විට, පදිංචි එම පරිශ්‍රයෙහි අයිතිකරු, බදුකරු, අධිකාරි, කළමනාකරු, නැවක හෝ යාත්‍රාවක කපිතාන්වරයා හෝ ඉහත කී පරිශ්‍රය භාරව සිටින වෙනත් තැනැත්තෙක් ඇතුළත් වේ ;

" ජීවියා" යන්නට ශාක, බැක්ටීරියා, ඇල්ගී, දිලීර, ෆයිටෝප්ලාස්මා, මයෝප්ලාස්මා, මයිකෝප්ලාස්මා වැනි විභවයන්, ප්‍රොටෝසෝආ, පෘෂ්ඨ වංශික සහ අපෘෂ්ඨ වංශික සතුන් මෙන්ම වෛරස, විරොයිඩ ප්ලාස්මීඩ, භක්ෂ හෝ ඒවාට සම්බන්ධ යම් ජීවී විභවයන් ද ඇතුළුව, සක්‍රීය ආසාදක හෝ සුප්ත තත්ත්වයක පසුවන්නා වූ ද ස්වාභාවිකව හෝ ජාන විකරණය කරන ලද හෝ ජීව විකරණය කරන ලද හෝ අන්‍යාකාරයක හෝ, ජීවත්ව ඇතැයි සලකනු ලබන්නා වූ ද කවර හෝ ජීව රූපයක් ඇතුළත් වේ ;

" අයිතිකරු" යන්නෙන්, යම් ශාකයක්, ශාක හෝ ජීවියෙක් දරන තැනැත්තා හෝ එහි සන්තකය දරන තැනැත්තා අදහස් වේ ;

" පළිබෝධය" යන්නෙන්, යම් ශාකයකට හෝ ශාක නිෂ්පාදනයකට හානි කිරීමට හෝ අලාභ කිරීමට හෝ පාඩු සිදු කිරීමට හැකියාව ඇති යම් ජෛව අණුයෝජකයකු අදහස් වන අතර, එයට වල් පැළෑටි ද ඇතුළත් වේ ;

" ශාකය" යන්නෙන්, ජීවත්වන හෝ මිය ගිය ශාක සංඝතියට අයත් සියලු සාමාජිකයන් අදහස් වන අතර, ඊට ශාකවල යම් කොටසක් හෝ කොටස් ද, ශාක බීජ ද අදහස් වේ ;

" ශාක නිෂ්පාදන" යන්නෙන්, ධාන්‍ය වර්ග ද ඇතුළුව ශාක මූලාරම්භයක් ඇති සියලු පිරි සැකසුම් නොකළ ද්‍රව්‍ය අදහස් වන අතර, ඒවායේ ස්වභාවයෙන් හෝ ඒවා පිරි සැකසුම් මගින් පිරි සැකසුම් හේතුව නිසා පළිබෝධයක් පැතිරීමේ අවදානම ඇති කළ හැකි වූ ද, ශාක මූලාරම්භයක් ඇති පිරිසැකසුම් කරන ලද නිෂ්පාදන ද මෙයට ඇතුළත් වේ ;

" පරිශ්‍රය" යන්නෙන්, ශාක තබා ගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හෝ වගාකිරීම සඳහා ද, ශාක නිෂ්පාදන තබාගැනීම, ගබඩා කිරීම හෝ ප්‍රවාහනය සඳහා ද, සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් භාවිත කරනු ලබන යම් ඉඩමක්, ජලාශ්‍රයක්. ගොඩනැගිල්ලක්, ආයතනයක්, ගබඩාවක්, කන්ටේනරයක්, වාහනයක්, යාත්‍රාවක්, ගුවන් යානාවක් හෝ වෙනත් ගමනාගමන ක්‍රමයක් ද අදහස් වේ ;

" නිරෝධායන පළිබෝධය" යන්නෙන්, ශ්‍රී ලංකාවෙහි යම් ප්‍රදේශයකට ආර්ථික හෝ පාරිසරික වටිනාකමක් ඇති එහෙත් එම ප්‍රදේශයේ දැනට පැතිරී නොමැති හෝ පැතිරී ඇතත්, බහුලව පැතිරී නොමැති සහ නිල වශයෙන් පාලනය කරනු ලබන යම් පළිබෝධයක් අදහස් වේ ;

" ලේකම්වරයා" යන්නෙන්, කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා අදහස් වේ ; සහ

" වල් පැලෑටි" යන්නෙන්, මිනිසා සහ ඔහුගේ කටයුතු සමග තරග වදින, නොනැවතී අනර්ථකාරීව සහ හානිකරව ඒ කටයුතුවලට බාධා පමුණුවන කිසියම් පැලෑටියක් අදහස් වේ:

(2) යම් ජීවියකුගේ විද්‍යාත්මක නාමයට මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයකින් කරන ලද යම් සඳහනක්, එම ජීවියා සඳහා භාවිතා කරනු ලබන සියලු අතික් පර්යාය නම්වලට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

(3) යම් පළිබෝධයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක කරන ලද යම් සඳහනක් එම පළිබෝධයාගේ පැවැත්මේ කවර හෝ අවස්ථාවක දී එම පළිබෝධයට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.